බවක් හඟවන පදය සම්බන්ධ විභක්ති අර්ථයේ යෙදේ. එබැවින් 'පුතාගේ' යන පදය සම්බන්ධ අර්ථ ගනී.

උදාහරණ

i. කුරුල්ලාගේ හඬ ඇතට ඇසේ.
ii. කුරුල්ලන්ගේ හඬ ඇතට ඇසේ.
iii. දරුවාගේ මුහුණ පියකරු ය.
iv. දරුවන්ගේ මුහුණු පියකරු ය.

ඉහත සඳහන් වාක්‍යවල කිසියම් අයිතියක්, සම්බන්ධකමක් පිළිබඳ අර්ථය දෙන්නේ කුරුල්ලාගේ, කුරුල්ලන්ගේ, දරුවාගේ, දරුවන්ගේ යන පදවලිනි. ඒ නිසා ඒ පද සම්බන්ධ විභක්ති අර්ථ ගනී.

1. මේ වාක්‍යවල සම්බන්ධ විභක්ති අර්ථ ගත් පද යටින් ඉරක් අඳින්න.
   i. ඇතාගේ දළ දිග ය.
   ii. ගුරුවරුන්ගේ උපදෙස් පිළිපදිමු.
   iii. වෙසක් උත්සවය බෞද්ධයන්ගේ ආගමික උළෙලකි.

2. සම්බන්ධ විභක්ති අර්ථයේ යෙදුණු නාම පද ඇතුළත් වාක්‍ය පහක් ලියන්න.

## 8. ආධාර විභක්තිය

පුතා කෙරෙහි දැඩි සෙනෙහසක් මට ඇති විය.

මේ වාක්‍යයේ මට සෙනෙහස ඇති වීමට ආධාර වී ඇත්තේ පුතා ය. ඒ නිසා 'පුතා කෙරෙහි' යන්න ආධාර අර්ථයෙහි යෙදී ඇත.